## සාරාංශය

කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ, අධ්‍යාපනපති උපාධියට අවශ්‍ය අධ්‍යාපන අවශ්‍යතාවයක් ඉටු කිරීම සඳහා මෙම අධ්‍යයනය දියත් කරන ලදී.

දීර්ඝ කාලීන වශයෙන් ශ්‍රී ලාංකික අධ්‍යාපන පද්ධතියට එල්ල වන චෝදනාවක් නම් පවතින විභාග ක්‍රමය හරහා සිසුන්ගේ දක්ෂතා, කුසලතා නිසි ආකාරයට මිණුම් කළ නොහැක යන්නයි. මේ නිසා 1972 වසරෙන් පසුව ඉගනුම් ඉගැන්වීම් ක්‍රියාදාමය නව මාවතකට නැඹුරු වීම ඇරඹුණි. එම නව ආරම්භය වූයේ සිසුන්ගේ අනාගත සංවර්ධනය උදෙසා නිරන්තර ඇගයීම් ක්‍රමයක් ගැන අවධානය යොමු කිරීමයි. එසේ වූ නමුත් නව ප්‍රතිසංස්කරණයන් හරහා මතු වූ විවි ධ ගැටලුකාරී තත්වයන් නිසා කලින් කලට නව අංගයන් එකතු කරමින් මෙම ගැටලු ජය ගැනීම සඳහා විවිධ උත්සාහයන් ගනු ලැබුවද එය සාර්ථක වූ බවක් පෙනෙන්නට නොවිය.

මෑත කාලීනව ඒ සඳහා ගනු ලැබූ උත්සාහයන් අතර පාසල පදනම් කරගත් ඇගයීම් වැඩසටහන අධ්‍යාපන පද්ධතිය තුළ ඉමහත් ආන්දෝලනයකට ලක් නොවූ නමුදු අති සාර්ථක ලෙස ක්‍රියාත්මක වන අංගයක් ලෙස ද හැඳින්විය නොහැකි බව ඇතැම් අධ්‍යාපනඥයිගේ මතයයි.

ශ්‍රී ලාංකික අධ්‍යාපන පද්ධතියේ, ඇගයීම් ක්‍රමය තුළ පවතින දුර්වලතාවයන් මඟ හැරවීම සඳහා හඳුන්වා දෙන ලද පාසල පදනම් කරගත් ඇගයීම් වැඩසටහනේ අ:පො:ස: (සාමාන්‍ය පෙළ) මට්ටමේ බුද්ධ ධර්මය විෂයාශ්‍රිත පාසල පදනම් කරගත් ඇගයීම වැඩසටහන ක්‍රියාත්මක වන ආකාරය අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයෙන් අපේක්ෂා කෙරෙන අතර ඉන් පාසල පදනම් කරගත් ඇගයීම් වැඩසටහනේ අ:පො:ස: (සාමාන්‍ය පෙළ) මට්ටමේ බුද්ධ ධර්මය විෂයාශ්‍රිත පාසල පදනම් කරගත් ඇගයීම් ක්‍රියාත්මක කිරීමේදී භාවිතා කරනු ලබන ඇගයීම් ක්‍රමවේදයන් හඳුනා ගැනීම, එම ඇගයීම්වල යෝග්‍යතාවය සහ ප්‍රතිපෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක වන ආකාරය විමර්ශනය කිරීම ඇතුළුව සාමාන්‍ය පෙළ මට්ටමේ බුද්ධ ධර්මය විෂයාශ්‍රිත ඇගයීම් ක්‍රියාවලිය පිළිබඳව ගුරුවරුන්ගේ දැනුවත් භාවය කෙසේ පවතීද යන්න පිළිබඳව අධ්‍යයනය කෙරිණි.

### අධ්‍යනයයේ අරමුණු.

01. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) මට්ටමේදී බුද්ධ ධර්මය විෂයය හා සම්බන්ධ පාසල පදනම් කරගත් ඇගයීම්වලදී යොදා ගන්නා ක්‍රම හඳුනා ගැනීම.
02. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) මට්ටමේදී බුද්ධ ධර්මය විෂයාශ්‍රිතව යොදාගනු ලබන ඇගයීම්වල යෝග්‍යතාවය විමසා බැලීම.

03. බුද්ධ ධර්මය විෂයයට සම්බන්ධව පාසල පදනම් කරගත් ඇගයීම් ක්‍රියාවලිය යටතේ ප්‍රතිපෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක වන ආකාරය විමර්ශනය කිරීම.

04. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) මට්ටමේදී බුද්ධ ධර්මය විෂයාශ්‍රිතව පාසල පදනම් කරගත් ඇගයීම් ක්‍රියාවලිය පිළිබඳව ගුරුවරුන්ගේ දැනුවත් බව විමසා බැලීම.

## අධ්‍යයනයේ ක්‍රම පිළිවෙත.

කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ අධ්‍යාපන කලාපයට අයත් විවිධ ස්ථරයන් නියෝජනය වන පරිදි තෝරාගත් පාසල් 6කින් තෝරා ගත් 170ක ශිෂ්‍ය නියැදියක් සඳහා ඉදිරිපත් කරන ලද ප්‍රශ්නාවලියක් සහ ගුරුවරුන් 30 දෙනෙකු සහභාගි කරගනු ලැබූ ප්‍රශ්නාවලියක් හරහා මූලික වශයෙන් දත්ත ඒකරාශී කරගනු ලැබූ අතර එම දත්තයන් තහවුරු කර ගැනීම සඳහාත් ප්‍රශ්නාවලියෙන් ආවරණය නොවන කොටස් ඌණ පූර්ණය කිරීම සඳහා විදුහල්පතිවරුන් සහ ගුරු උපදේශකවරුන් සමඟ පැවති සම්මුඛ සාකච්ඡාවක් ඇතුළුව පාසල් 06න් පංති කාමර එක බැගින් තෝරාගෙන නිරීක්ෂණය කරන ලදී.

ඉහත ආකාරවලින් ඒකරාශී කරගනු ලැබූ දත්ත ප්‍රතිශත, වගු, ප්‍රස්තාර, චාට් සටහන් මගින් විශ්ලේෂණය කර නිගමන වලට එළඹෙන ලදී.

## නිගමන

01. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) මට්ටමින් බුද්ධ ධර්මය විෂයාශ්‍රිත පාසල පදනම් කරගත් ඇගයීම් ක්‍රියාත්මක කිරීමේදී ගුරුවරුන්ගෙන් වැඩි පිරිසක් ඇගයීම් ක්‍රමවේදයන් අතරින් ලිඛිත ඇගයීම් ක්‍රමයට නැඹුරු වී ඇති බව

02. ගුරුවරුන් විසින් ලිඛිත ඇගයීම් ක්‍රම වේදයට නැඹුරු වීමේ ප්‍රවණතාවය වැඩි වීම සඳහා පහසුවෙන් ක්‍රියාත්මක කළ හැකි වීම, ලකුණු ප්‍රදානය පහසු වීම, එක් පංතියක අධික ශිෂ්‍ය සංඛ්‍යාවක් සිටීම යන හේතු බලපා ඇති බව

03. සාමාන්‍ය පෙළ මට්ටමේ ශිෂ්‍යයන් මුහුණ දීමට කැමති ඇගයීම් ක්‍රමවේදයන් සහ ගුරුවරුන් විසින් ක්‍රියාත්මක කිරීමට පෙළඹී ඇති ඇගයීම් ක්‍රමවේදයන් අතර ගැළපීම අඩු බව.

04. අ.පො.ස. (සා.පෙ.) මට්ටමේ බුද්ධ ධර්මය විෂයාශ්‍රිතව යොදාගනු ලබන ඇගයීම් ක්‍රම වේදයන් සහ ඇගයීම් උපකරණ විෂයය පරමාර්ථ සහ අරමුණු ඉටුකර ගැනීමට දරන දායකත්වය අඩු බව.

05. ගුරුවරුන්ගෙන් වැඩි පිරිසක් බුද්ධ ධර්මය විෂයාශ්‍රිත ඇගයීම් ක්‍රියාත්මක කිරීමෙන් පසු ප්‍රතිපෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට දක්වන උනන්දුව ප්‍රමාණවත් නොවන බව.

06. ප්‍රතිපෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ඉදිරිපත් වන ගුරුවරුන්ගෙන් වැඩිම පිරිසක් සමස්ත පංති කාමරයම අදාළ කරගෙන ප්‍රතිපෝෂණ වැඩසටහන් දියත් කරන බව.

07. ප්‍රතිපෝෂණ වැඩසටහන් දියත් කිරීමේ ප්‍රවණතාවය අඩු වීමට කාලය ප්‍රමාණවත් නොමැති වීම ප්‍රබල හේතුවක්ව පවතින බව.

08. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) මට්ටමේ බුද්ධ ධර්මය විෂයාශ්‍රිත පාසල පදනම් කරගත් ඇගයීම් ක්‍රියාවලිය පිළිබඳව ගුරුවරුන්ගෙන් වැඩි පිරිසකට ප්‍රමාණවත් දැනුමක් නොපවතින බව.

## යෝජනා

01. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) මට්ටමේ බුද්ධ ධර්මය විෂයාශ්‍රිත පාසල පදනම් කරගත් ඇගයීම් ක්‍රමවේදයන් විවිධත්වයෙන් යුතුව ප්‍රිය ජනක ඉගනුම් අත්දැකීම් ජනිත කරමින් බුද්ධ ධර්මය විෂයය අරමුණු හා පරමාර්ථ ඉටුකරගත හැකි පරිදි ඇගයීම් සැලසුම් ප්‍රතිසංවිධානය කිරීම.

02. සාමාන්‍ය පෙළ ශ්‍රේණිවල බුද්ධ ධර්මය විෂයාශ්‍රිත ඇගයීම් ක්‍රියාත්මක කිරීමේදී නිපුණතා පදනම් කරගත් ඇගයීම් වැඩසටහනක් සකස් කිරීම.

03. නව ඇගයීම් ක්‍රමවේදයන් භාවිතා කිරීම සඳහා විෂයානුබද්ධව සැබෑ පංති කාමර අත්දැකීම් ඇසුරින් ගුරුවරුන් පුහුණු කළ යුතු බව

04. පාසල පදනම් කර ගත් ඇගයීම් වැඩසටහන පිළිබඳව ගුරුවරුන් දැනුවත් කිරීමේ සන්නිවේදන ජාලය වෙනස් විය යුතු බව.

05. පාසල පදනම් කරගත් ඇගයීම් වැඩසටහනේ සාර්ථකත්වය උදෙසා ප්‍රමාණාත්මකව නොව ගුණාතමකව ඇගයීම් සම්පූර්ණ කිරීම සඳහා ගුරුවරුන් පෙළඹවිය යුතු බව.

## Summary

This study was launched in order to meet the academic requirement of the Master of Education Degree programme of the Faculty of Education at the University of Colombo.

We have witnessed a revolution in assessment programmes at schools in past ten years. Australia, Britain, Canada, Europe, New Zealand, and United States have rebuilt their assessment programmes and also many developing countries have tried to introduce formative assessment programmes to operate in parallel with summative assessments. Reconceptualization of assessment programme is required to achieve the educational goal of enabling students to be effective thinkers and problem solvers. School based Assessment programme (SBA) is one of a number of initiatives taken in 1994 by the government of Sri Lanka with a view of reform the education system to achieve above goals.

The main objectives of the SBA programme were to improve students` learning process, to improve teachers` teaching process and to improve assessment process in order to make teaching and learning more efficient, effective and transform the school environment from an evaluation culture to an assessment culture.

A long term allegation against the education system of Sri Lanka is the inability to assess the skills and abilities of the students through the existing examination structure in the proper manner. Therefore, a tendency of following a new direction in the process of education commenced after 1972. This new beginning is to pay attention to continues assessment system for the future development of the students. Nevertheless, various attempts made to overcome the problematic situations.

Some Educators are of the view that, although the school based assessment programme that was one among the attempts made in the recent time did not create a controversy in the Education system, but also cannot be treated as a very successful feature in operation.

While it was expected to study the operation of the SBA programme related to the subject of Buddhism at G.C.E. (Ordinary Level), introduced to rectify the weaknesses of the school based assessment programme in the School Education system. The identification of the methods used in the school based assessment (SBA) of the subject of Buddhism at G.C.E. (Ordinary Level). The suitability of those assessments and investigating the manner of operation of feedback programmes under SBA programme related to the subject of Buddhism. And the level of awareness of the teachers on SBA programme related to Buddhism in Ordinary level classes.

## The objectives of the Study

1. Identification of which assessment methods used in school based assessment (SBA) programme in relevant to subject of Buddhism in General certificate of Education ordinary level (G.C.E. O/L) classes.
2. Examine the suitability of school based assessment (SBA) in relevant to subject of Buddhism in General certificate of Education ordinary level (G.C.E O/L) classes.
3. Examine the manner of operation of feedback programmes under the School based assessment (SBA) process related to the subject of Buddhism in General certificate of Education ordinary level (G.C.E. O/L) classes.
4. Examine the awareness of the teachers relating to the subject of Buddhism related school based assessment (SBA) process at General Certificate of Education Ordinary level. (G.C.C. O/L).classes.

## Procedure of the Study

Data were collected primarily through a questionnaire participating 30 Teachers and a questionnaire presented to a sample of 170 students selected from 6 schools chosen representing various levels belonged to the Colombo Education zone in the Colombo District and for confirmation of the said data and to supplement the sections not covered by the questionnaires, in addition

to a discussion held with the School Principals and the Teacher Counselors , observations were carried out selecting one each out of the 6 schools.

The conclusions were arrived at analyzing the data collected in the aforesaid manner, by way of percentages, graphs, charts and diagrams.

## Conclusions of the Study

1. In the implementation of school based assessment (SBA) in subject of Buddhism a majority of the Teachers are prone to written assessment methods out of the available assessment methods.
2. The reasons which led to the increasing tendency of the teachers relying on the written assessment methods are the easy implementation, easy allocation of marks, and the presence of excessive number of students in a class.
3. Less compatibility between the assessment methods in relevant to subject of Buddhism preferred by the Ordinary Level students and the assessment methods inclined to be followed by the teachers.
4. Low level of contribution of the assessment methods and assessment instruments used in the General Certificate of Education level (G.C.E. O/L) classes in relevant to subject of Buddhism for achievement of the subject purposes and objectives.
5. Inadequate interest taken by majority of the teachers for feedback programmes after implementation of the Buddhism subject related assessments.
6. Greater majority of the teachers who come forward for implementation of feedback programmes, do so covering the entire class room.
7. Inadequacy of time becomes a major cause for low tendency of launching of feedback programmes.
8. Inadequacy of knowledge among majority of the teachers relating to school based assessment (SBA) programme on subject of Buddhism.

## Suggestions

1. Reorganize the methodology to include variety, making it an attractive learning experience, in a manner capable of achievement of purpose and objective of subject of Buddhism.
2. Impliment a skill base assesment programme for General Certificate of Education level for subject of Buddhism.
3. In order to use new school base assessment methods, teachers to be trained with real class room experiences.
4. Communication network for educating the teachers regarding school based assessment programme should be modified.
5. For the success of the school based assessment programme (SBA), the teachers should be motivated not for quantitative but for qualitative completion of the assessments.